# (ආ) දේශීය කෘෂිකර්මය

## 1. කෘෂිකාර්මික නිෂ්පාදනය

### (i) සැලකිය යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම්

ආහාරයෙන් ස්වයංපෝෂිතභාවය ලබා ගැනීමට සහ දේශීය කෘෂිකර්මයෙහි සංවර්ධනය තහා සිටුවීමට නව පියවර කීපයක් ගන්නා ලදී.

වී අලෙවි මණ්ඩලයට, වී විකුණන නිෂ්පාදකයින්ට ගෙවනු ලබන මුදලින් කිසියම් නියමිත අඩු කර ගැනීම් කිරීමට සහ මෙම අඩු කර ගැනීම් නිෂ්පාදකයින්ගේ නමින් වන පුද්ගලික ඉතුරුම් ගිණුම්වලට බැර කිරීමට 1973 අංක 9 දරන වී නිෂ්පාදකයින්ගේ ඉතිරි කිරීම් නීතිය මගින් වී අලෙවි මණ්ඩලයට බලතල පවරන ලදී. වී නිෂ්පාදකයින් වයස අවුරුදු 60 ළඟාවූ විට හෝ (ගැහැණු නම් වයස අවුරුදු 55) ඔවුන් නිෂ්පාදනය නවත්වා වෙනත් රැකියාවක යෙදීම, කායික වශයෙන් නුසුදුසු තත්ත්වයක සිටීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව යාම ආදී අවස්ථාවන්හිදී නිෂ්පාදකයින්ට එම මුදල ආපසු ගෙවිය යුතුය.

භෞමිනට සිදුවන පාඩුවලදී වන්දි සැලසීම, ගොවිපල ආදායම ස්ථාවර කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා නියමිත බෝග සහ සත්ව පාලනයට අංග සම්පූර්ණ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලයක් පිහිටුවීමට 1973 අංක 27 දරණ කෘෂිකාර්මික රක්ෂණ නීතියෙන් බලාපොරොත්තු වෙයි. වෙනත් දේ අතර, රක්ෂණ වාරිකය මුදල්වලින් හෝ ද්‍රව්‍යවලින් ගෙවීමට මෙම නීතිය ඉඩ සලසයි. සහතික මිළ ක්‍රමය යටතේ භෝග විකිණීමෙන් ලැබෙන මුදල්ද වාරිකය ගෙවීම සඳහා යොදා ගත හැක.

1958 අංක 1 දරණ කුඹුරු පනත වෙනුවට 1973 අංක 42 දරණ කෘෂිකාර්මික ඉඩම් නීතිය පැනවූ අතර එමගින් අඳයට කුඹුරු ගොවිතැන් කරන ගොවියාගේ අඳ අයිතිය ආරක්ෂා කිරීමටද, අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු කුලිය නිරණය කිරීමටද, ගොවි කාරක සභා පිහිටුවීම සහ කෘෂිකාර්මික විනිශ්චය සභා මගින් සියළු කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධව අඳ සහ අනෙකුත් අරගල නිගමනය කිරීමටද ඉඩ සළසා ඇත. කෘෂිකාර්මික ඵලදා වර්ධන නීතිය (පහත දක්වේ) යටතේ පිහිටුවනු ලැබූ ඵලදා වර්ධන කමිටුවල නියෝජිතයින් වශයෙන් ක්‍රියා කිරීම සහ සියළුම කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් ස්වකීය කාර්‍යයන් ඉටු කිරීමද කෘෂිකාර්මික කමිටු විසින් කළ යුතුය.

1973 අංක 43 දරණ රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) නීතිය, කෘෂිකාර්මික සංවර්ධන පරමාර්ථය සඳහා සමහර නියමිත පංතිවල පුද්ගලයින්ට රජයේ ඉඩම් විධිමත් ක්‍රමයකට විකිණීමට සහ ඉඩම් සංවර්ධන ආඥා පනතේ සමහර විධිවිධාන අවලංගු කිරීමටද ඉඩ සලසයි.

ඉහතින් සඳහන් කරන ලද නීති 1973 දී සම්මත විය. 1972 දී සම්මත කරන ලද නීතිවලින් 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියත්, 1972 අංක 2 දරණ කෘෂිකාර්මික ඵලදා වර්ධන නීතියත් කෘෂිකාර්මික දියුණුවට අදළ ඉතා වැදගත් නීතීන් විය. ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම ස්ථාපනය කළ අතර සමහර කෘෂිකාර්මික ඉඩම් මෙම කොමිසම යටතට පැවරීමටද ඉඩ සැලසීය. ඵලදායිතාවය සහ සේවා නියුක්තිය වැඩිවන පරිදි ඉඩම් නැවත පවරා දීම කොමිසම සතු විය.

ඉඩම් අක්කර 4,50,000 ක් පමණ මෙම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතට පැවරේ යයි මුලින් ඇස්තමේන්තු කරන ලදී. 1973 වර්ෂය අවසානයේදී අක්කර 2,95,000 ක් (නැතහොත් සියයට 65·6 ක්) කොමිසම යටතට පැවරිණ. කොමිසම විසින් විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලට සහ සංවිධානවලට දනටමත් පවරන ලද ඉඩම් පිළිබඳ විස්තර මෙසේය.

| | අක්කර |
|---|---|
| රාජ්‍ය වැවිලි සංස්ථාව ( ප්‍රධාන වශයෙන් තේ සහ රබර් ) | 5,914 |
| උඩරට සමුපකාර සංවර්ධන මණ්ඩලය ( ප්‍රධාන වශයෙන් තේ ) | 5,487 |
| පොල් වගා කිරීමේ මණ්ඩලය ( ප්‍රධාන වශයෙන් පොල් ) | 287 |
| රජයේ දෙපාර්තමේන්තු | 224 |
| පුද්ගලික සංවිධාන | 100 |
| දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලධාරීන් යටතේ | 1,007 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සමුපකාර | 4,173 |
| විවිධ සේවා සමුපකාර සමිති | 2,135 |
| | 19,327 |

පවරා ගන්නා ලද ඉඩම් වලින් සියයට 6·6 ක් බෙද දී ඇති බව ඉහත දැක්වෙන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. ඊට අමතරව ඉඩම් අක්කර 1,680 ක් පමණ 1973 දී විකිණීම සඳහා නිර්දේශ කර ඇත.

නිසියාකාර යොදගැනීම සහ පරිපාලනය මගින් කෘෂිකාර්මික ඉඩම්වල උපරිම ඵලදාවක් ලබා ගැනීම 1972 අංක 2 දරණ කෘෂිකාර්මික ඵලද වර්ධන නීතියෙන් අදහස් කරන ලදී. සත්ව පාලනය හා කෘෂිකාර්මික භෝග පිළිබඳව කාර්යක්ෂම පරිපාලනයක් සඳහාත්, ඵලද වර්ධන කමිටු සහ කෘෂිකාර්මික විනිශ්චය සභා පිහිටුවීමටත් මෙම නීතිය ඉඩ සලසයි. මෙම පනත ප්‍රශස්ත ආකාරයකින් ඉඩම් වගා කිරීම සඳහා අයිතිකරුවනට සහ පදිංචිකරුවන්ට වගකීම් පවරයි. මෙම පරමාර්ථය සඳහා කෘෂිකාර්මික සහ ඉඩම් ඇමතිතුමා ඔහුගේ අභිමතය පරිදි නියමිත තෝරා ගත් භෝග සහ සත්ව වර්ග, වගා ක්‍රම සහ භෝග රටාවන් තීරණය කිරීම සහ අනිකුත් දේ අතර, ජල පාලනය සහ පස සංරක්ෂණයට අදාළ නීතිරීති නිර්දේශ කිරීම මෙහෙයවනු ඇත. මෙම ඵලද වර්ධන නීතිය යටතේ පිහිටුවනු ලබන කෘෂිකාර්මික ඵලද වර්ධන කමිටු ඇමතිතුමා මගින් පත් කරනු ඇත. කෘෂිකර්මයේ නියුතු අයගේ ඕනෑ එපාකම් නියෝජනය වන පරිදි මෙම කමිටු පුද්ගලයන් 10 කට නොවැඩි සංඛ්‍යාවකින් (හෝ ඇමතිතුමා විසින් සුදුසු යැයි සිතනු ලබන එවැනි අනෙකුත් පුද්ගලයින් ගෙන්) සංයුක්ත කෙරේ. තවද ඔවුන් කෘෂිකාර්මික කටයුතු ඒකාබද්ධ කිරීමේ සහ වර්ධනය කිරීමේ කාර්යයෙහිද අනුයුක්ත කෙරේ. ඵලද වර්ධන කමිටුවලට ස්වකීය කටයුතු කාර්යක්ෂමව කිරීමට හැකිවනු වස් ඒවාට දේපළ පවරා ගැනීමට සහ බෙද දීමටද කෘෂිකාර්මික ප්‍රතිපත්තීන් සම්පාදනය කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට හා සැපයීමටද, වැඩ සටහන් යෝජනා කිරීමටද වසරකට අක්කරයකට රුපියල් 6 ක් දක්වා අක්කර බද්දක් එකතු කිරීමටද, ණය ඉල්ලුම් කරුවන්ගේ සුදුසුකම් නිගමනය කිරීමට ලංකා බැංකුවට සහාය වීමටද, වෙනත් දෑ අතර, බලතල පවරා ඇත.

සෑම කෘෂිකාර්මික ඵලදා වර්ධන කමිටු වකටම එහි ප්‍රයෝජනය සඳහා කෘෂි සේවා මධ්‍යස්ථානයක ඇති පහසුකම් ලැබෙනු ඇත. 438 ක්වූ මුළු කෘෂි සේවා මධ්‍යස්ථානවලින් ( දළ වශයෙන් සෑම ගම්කාර්ය සභාවකම පිහිටවූ ) 83 ක් 1973 වර්ෂයේදී පිහිටුවන ලදී. මෙ සෑම මධ්‍යස්ථානයකටම ලංකා බැංකු උප ශාඛාවක්ද, කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයක්ද, වෙළඳ සැලක් සහ කෘෂිකාර්මික විනිශ්චය සභාවක්ද තිබෙනු ඇත. ඵලද වර්ධන කමිටුවේ මෙහෙය වීම යටතේ මෙම මධ්‍යස්ථාන මගින් මධ්‍යගත කරන ලද අලෙවි ක්‍රමයක්ද, වගා රක්ෂණය සහ අනෙකුත් සේවාවන්ද සපයනු ලැබේ.

1973 හදිසි අනපනත් අංක 1 ( ආහාර බෝග වගා කිරීම ) වශයෙන් දක්වා ඇති මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි අනපනත් නිකුත් කරන ලදී. ආහාර නිෂ්පාදන වැඩ

සටහනෙහි මූලික පරමාර්ථය වූයේ, මෙම ( හදිසි ) නීතිරීති යටතේ සියළුම වගා කළ හැකි ඉඩම් නියමිත භෝග වගාවන් යටතට පත්කිරීමය. අනිකුත් අයට පවරාදීමේ සහ මෙම භෝගයන් වගාකිරීමට හැකි හා කැමති පුද්ගලයන්ට ඉඩම් පවරා දීමේ තර්ජනය යටතේ මෙම නීතිරීති සෑම අයිතිකරුවකුටම හෝ පදිංචිකරුවකුටම වගා නොකළ ඉඩම්වල වී, මඤ්ඤොක්කා, බතල හා අලවර්ග යනාදිය වගා කිරීමට බල කිරීමක් ඇති කරයි. සමහර අවස්ථා යටතේ ඉඩම් අයිතිකරුවන්ට හා පදිංචිකරුවන්ට යළිත් ලබාදීමට සහ නව වගාකරුවන් විසින් කලින් අයිතිකරුට හෝ පදිංචිකරුට සතුටුදයක බිම් බද්දක් ගෙවීමට විධිවිධානයක් සළසා ඇත. ආහාර නිෂ්පාදන වැඩ පිළිවෙල සංවිධානය හා සම්බන්ධීකරණය සහ ජන සහයෝගය ඒකරාශී කිරීමට, ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කොමිටියක දිස්ත්‍රික්ක දේශපාලන අධිකාරිය මූලික ලෙස ක්‍රියා කරයි.

(ii) ක්‍රියාකාරිත්වය

(අ) වී උප අංශය:

1972/73 මහ[1] සහ 1973 යල කන්නයන්හිදී වී උප අංශයෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දත්තයන් II ( ආ ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**මහ 1972/73:** 1972/73 මහ කන්නයේදී වපුරන ලද බිම් ප්‍රමාණය අක්කර ලක්ෂ 12 ක් නැතහොත් සමස්තයක් වශයෙන් පසුගිය මහ කන්න පහේදී වපුරන ලද අක්කර ප්‍රමාණයට සමානවන නමුත්, 1971/72 මහ කන්නයේදී වපුරන ලද ප්‍රමාණයට වඩා සියයට 0·6 කින් අඩු වේ. කන්නය තුළදී අස්වැන්න ලබාගත් ශුද්ධ බිම් ප්‍රමාණය ඊට ඉහත මහ කන්නයේදී ලබාගත් ප්‍රමාණයට වඩා සියයට 4·8 ක් වැඩිය. 1972/73 මහ කන්නයේදී වපුරන ලද බිම් ප්‍රමාණයෙන් අස්වැන්න ලබා නොගත් ප්‍රමාණය සියයට 8·0 ක්වූ අතර, එය පසුගිය මහ කන්නයේදී වූ සියයට 12·7 ට වඩා සැලකිය යුතු පරිදි අඩු වුවද, දළ වශයෙන් පසුගිය මහ කන්න පහේදී අස්වැන්න ලබා නොගත් සාමාන්‍ය බිම් ප්‍රමාණයට සමාන වේ.

1972/73 මහ කන්නයේ අස්වැන්න ලබාගත් අක්කර ප්‍රමාණය පසුගිය මහ කන්නයට වඩා සියයට 4·8 කින් වැඩි වුවද, මුළු නිෂ්පාදනයෙහි එවැනි සමාන්තර වැඩිවීමක් නොවීය. මුළු නිෂ්පාදනය වැඩි වූයේ සියයට 0·4 කිනි. මෙයට හේතු වූයේ 1971/72 මහ කන්නයේ අක්කරයකින් ලබාගත් බුසල් 48·1 ක අස්වැන්න ප්‍රමාණය 1972/73 මහ කන්නයේදී සියයට 5·4 කින්, බුසල් 45·5 දක්වා අඩුවීමය. මූලික වශයෙන් බලපෑ අයහපත් කාලගුණික තත්ත්වයන් අස්වැන්නේ මෙම අඩුවීමට හේතු වූවා විය හැක. පොහොර නිකුත් කිරීමෙහි[2] සියයට 0·2 ක කැපී නොපෙනෙන වැඩිවීමටත් දියුණු වී වර්ග යටතේ වගා කළ ඉඩම් ප්‍රමාණය සියයට 0·7 කින් අඩුවීමටත් මෙම අයහපත් කාලගුණික තත්ත්වය තරමක් දුරට බලපාන්නට ඇත.

**1973 යල:** 1973 යල කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණය අක්කර ලක්ෂ 6 ක් විය. එය දළ වශයෙන් පසුගිය මහ කන්නයේ වපුරන ලද ප්‍රමාණයෙන් අඩක් වූ අතර පසුගිය යල කන්නයේදී (1972) වපුරන ලද බිම්ප්‍රමාණයට වඩා සියයට 0·8 කින් වැඩිය. 1973 යල කන්නයේදී වපුරන ලද අක්කර ප්‍රමාණය සලකා බලනවිට එය පසුගිය යල කන්න පහේදී වපුරන ලද සාමාන්‍ය අක්කර ප්‍රමාණයෙන් කැපී පෙනෙන වෙනසක් නොදක්වයි. 1973 යල කන්නයේදී අස්වැන්න ලබාගත් ශුද්ධ බිම් ප්‍රමාණය පෙර යල කන්නයට වඩා සියයට 5·7 කින් වැඩිවූ අතර, එය 1968 සිට 1972 අතර කාලයේදී අස්වැන්න ලබාගත් සාමාන්‍ය අක්කර ප්‍රමාණය වූ සියයට 0·9 ට වඩා වැඩිය. 1973 දී වපුරන ලද බිම් ප්‍රමාණයෙන් සියයට 6·3 ක අස්වැන්න ලබා නොගත්තේය. මෙම පහත වැටීම 1972 යල කන්නයේදී පහත වැටුනු සියයට 10·7 ක්වූ ප්‍රමාණයට වඩා අඩුවන අතර, 1968 සිට 1972 දක්වා වූ පස් අවුරුදු කාලයේදී පහත වැටුණු ප්‍රමාණයට දළ වශයෙන් සමාන වේ.

---

1. මහ සහ යල යනුවෙන් කන්න දෙකකින් වගා වර්ෂය සෑදේ. මහ කන්නය සැප්තැම්බර්/ඔක්තෝබර් සිට මාර්තු/අප්‍රේල් දක්වාත්, යල කන්නය අප්‍රේල්/මැයි සිට අගෝස්තු/සැප්තැම්බර් දක්වාත් වෙයි.

2. දත්තයන්, වී වගාවෙහි නියම වශයෙන් භාවිතා කළ පොහොර වශයෙන් නොව විවිධ සේවා සමුපකාර සමිති මගින් නිකුත් කළ පොහොර ප්‍රමාණයන් වශයෙන් දැක්වෙන නිසා එලදවේ වෙනයක්ම විස්තර කිරීම සඳහා ප්‍රමාණවත් නොවිය හැකිය.

## II (අා) 1 වැනි සංඛ්‍යා සටහන

### 1972/73 වගා වර්ෂයෙහි* දිස්ත්‍රික්ක අනුව ක්‍රියාකාරිත්වය—වී උප අංශය**

| දිස්ත්‍රික්කය | කලාපය | වැපුරූ ප්‍රමාණය (අක්කර) | | අස්වැන්න නෙලා ගත් ශුද්ධ ප්‍රමාණය (අක්කර) | | නිෂ්පාදනය (බුසල් '000) | | අක්කරයක එලදාව (බුසල්) | | දියුණු කළ වර්ග යටතේ වූ බිම් ප්‍රමාණය (අක්කර) | | පොහොර නිකුතුව (ටොන්) | | ස. මි. ක්‍ර. යටතේ මිලට ගැනීම (බුසල් '000) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මහ 1972/73 | යල 1973 | මහ 1972/73 | යල 1973 | මහ 1972/73 | යල 1973 | මහ 1972/73 | යල 1973 | මහ 1972/73 | යල 1973 | මහ 1972/73 | යල 1973 | මහ 1972/73 | යල 1973 |
| කොළඹ .. | තෙත් | 58,454 | 45,512 | 48,144 | 37,867 | 1,711 | 1,425 | 34·55 | 37·62 | 35,098 | 31,762 | 1,603·8 | 1,014·8 | 22 | 3 |
| කළුතර .. | තෙත් | 43,108 | 42,078 | 34,320 | 34,098 | 1,016 | 1,012 | 29·62 | 29·67 | 11,023 | 9,508 | 1,009·9 | 1,078·9 | 85 | 6 |
| ගාල්ල .. | තෙත් | 47,055 | 49,132 | 38,305 | 40,474 | 913 | 1,071 | 23·82 | 26·47 | 15,904 | 18,850 | 875·6 | 1,916·8 | 99 | 25 |
| මාතර .. | තෙත් | 46,035 | 46,355 | 32,160 | 37,596 | 991 | 1,343 | 30·82 | 35·72 | 30,451 | 23,042 | 921·2 | 990·7 | 121 | 119 |
| පුත්තලම .. | වියලි | 25,127 | 8,504 | 19,151 | 6,248 | 683 | 215 | 35·65 | 34·42 | 21,011 | 8,632 | 331·9 | 157·8 | 238 | 18 |
| කුරුණෑගල .. | වියලි | 145,335 | 96,559 | 109,419 | 67,669 | 4,475 | 2,789 | 40 90 | 41·22 | 92,367 | 70,936 | 3,097·7 | 2,337·5 | 1,512 | 93 |
| කෑගල්ල .. | තෙත් | 27,503 | 23,241 | 22,443 | 17,728 | 944 | 858 | 42·08 | 48·40 | 19,954 | 17,110 | 740·0 | 552·6 | 111 | 11 |
| රත්නපුර .. | තෙත් | 40,338 | 36,264 | 33·533 | 30,466 | 1,364 | 1,241 | 40·67 | 40·72 | 15,754 | 13,965 | 563·7 | 1,388·8 | 582 | 238 |
| නුවර .. | තෙත් | 48,615 | 40,301 | 40,955 | 33,630 | 2,724 | 1,786 | 66·52 | 53·12 | 41,456 | 20,519 | 1,548·9 | 992·0 | 761 | 314 |
| මාතලේ .. | වියලි | 24,219 | 13,398 | 18,635 | 10,338 | 936 | 438 | 50·20 | 42·47 | 20,007 | 8,816 | 542·8 | 364·5 | 547 | 73 |
| නුවරඑළිය .. | තෙත් | 18,037 | 11,058 | 15,197 | 9,366 | 949 | 641 | 62·48 | 68 40 | 13,457 | 7,667 | 141·3 | 85·6 | 113 | 5 |
| බදුල්ල .. | තෙත් | 31,547 | 10,683 | 26,360 | 8,739 | 1,610 | 507 | 61·10 | 58·02 | 29,749 | 7,962 | 559·2 | 170·1 | 447 | 109 |
| මොණරාගල .. | වියලි | 17,856 | 3,859 | 14,262 | 3,227 | 872 | 169 | 61·15 | 52·20 | 17,007 | 2,154 | 263·1 | 75·6 | 448 | 64 |
| යාපනය .. | වියලි | 82,779 | 9,007 | 58,552 | 7,556 | 2,115 | 315 | 36·12 | 41·67 | 50,642 | 9,332 | 2,586·6 | 1,716·7 | 857 | 3 |
| වවුනියාව .. | වියලි | 45,383 | 1,473 | 37,122 | 1,209 | 1,568 | 58 | 42·25 | 47·92 | 44,381 | 1,596 | 755·7 | 175·1 | 1,063 | 3 |
| මන්නාරම .. | වියලි | 35,007 | 2·009 | 29,063 | 1,696 | 1,624 | 94 | 55·85 | 55·67 | 42,117 | 1,824 | 875·3 | 179·9 | 832 | 10 |
| අනුරාධපුරය .. | වියලි | 118,850 | 25,665 | 89,870 | 20,583 | 4,700 | 850 | 52·30 | 41·27 | 75,531 | 16,550 | 711·6 | 326·8 | 2,422 | 346 |
| පොළොන්නරුව .. | වියලි | 62,616 | 43,557 | 52,939 | 36,679 | 4,106 | 2,161 | 77·57 | 58·92 | 54,087 | 32,281 | 2·020·2 | 748·4 | 3,383 | 1,128 |
| ත්‍රිකුණාමලය .. | වියලි | 37,556 | 6,131 | 29,282 | 4,951 | 1,413 | 272 | 48·25 | 54·97 | 37,713 | 4,413 | 734·0 | 128·9 | 1,118 | 139 |
| මඩකලපුව .. | වියලි | 82,655 | 20,977 | 59,740 | 15,085 | 2,046 | 695 | 34·25 | 46 05 | 77,351 | 12,754 | 2,084·5 | 733·7 | 725 | 46 |
| අම්පාර .. | වියලි | 94,351 | 51,759 | 74,835 | 43,081 | 3,215 | 1,946 | 42·95 | 45·17 | 80,974 | 42,454 | 608·5 | 1,758·1 | 2,084 | 792 |
| හම්බන්තොට .. | වියලි | 46,543 | 25,611 | 38,068 | 20,165 | 2,029 | 1,010 | 53·30 | 50·07 | 40,486 | 19,642 | 724·9 | 583·1 | 1,125 | 403 |
| ශ්‍රී ලංකාව .. | | 1,178,969 | 613,133 | 922,355 | 488,451 | 42,004 | 20,896 | 45·54 | 42·78 | 866,520 | 381,769 | 23,300·4 | 17,476·4 | 18,695 | 3,948 |

මූලයන්: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

* වගා වර්ෂය 1972/73 මහ (සැප්තැම්බර්/ඔක්තෝම්බර්—මාර්තු/අප්‍රියෙල්) සහ 1973 යල (අප්‍රියෙල්/මැයි—අගෝස්තු/සැප්තැම්බර්) යන කන්න වලින් යුක්ත වෙයි.

** තාවකාලික දත්තයයි

1973 යල කන්නයේදී අස්වැන්න ලබාගත් බිම් ප්‍රමාණය සියයට 5·7 කින් වැඩිවූවත්, එම කන්නයේ නිෂ්පාදනයේ වැඩිවීමත් සමග (නිෂ්පාදනය වැඩි වූයේ සියයට 1·6 කින් පමණි) එය නොගැලපේ මෙම අසමානත්වය, 1972 යල කන්නයේ අක්කර එකකට බුසල් 44·5 ක් වූ අස්වැන්න ප්‍රමාණය 1973 යල කන්නයේදී අක්කර එකකට බුසල් 42.8 දක්වා, එනම් සියයට 4 ක පහළ වැටීම කින් පැහැදිළිවේ. 1973 යල කන්නයේදී නිකුත් කළ පොහොර ප්‍රමාණ යෙහි[1] සියයට 45·0 ක සහ දියුණු කළ වී වර්ග යටතේ වගා කළ බිම් ප්‍රමාණයෙහි සියයට 0·5 ක වැඩිවීමක් දත්තයන් මගින් පෙන්නුම් කළද ඵලදාවෙහි පහත වැටීමට, අනෙක් දෑ අතර, හේතු විය හැක්කේ ගොවීනට පොහොර හා අනෙකුත් යෙදවුම් සැපයීමෙහි වූ ප්‍රමාදයන් සහ වී වලට නිකුත් කළ පොහොර අනෙකුත් භෝගවලට යෙදවීම වැනි සාධකය.

**1972/73 වගා වර්ෂය:** 1972/73 වගා වර්ෂය සමස්තයක් වශයෙන් සලකන කළ, 1972/73 සඳහා 152·0 ක් වන භෝග වගා දර්ශකය[2] 1967/68-1971/72 පස් අවුරුදු කාලසීමාව සඳහා වන 152·3 ක්වූ, සාමාන්‍ය භෝග වගා දර්ශකය හා සැසඳූ කල මෙම වසර තුළ ඉඩම් ප්‍රයෝජනයට ගැනීමේ සූක්ෂමතාවය අනිවාර්යයෙන්ම නොවෙනස්ව පැවති බව පෙන්නුම් කරයි. එහෙත්, එය ඉකුත් වගා වර්ෂයේ සංඛ්‍යාව වන 151·3 ට ඉතා සුළු වශයෙන් වැඩිවිය. 1972/73 වගා වර්ෂයේ මුළු වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 629 ක් වූ අතර, මෙම වසරේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉකුත් වසරේ අනුරූප සංඛ්‍යාවෙන් වෙනස් නොවීය. ඉකුත් වසරේ අක්කරයකට බුසල් 46·6 ක්වූ සාමාන්‍ය ඵලදාව හා දක්වන කල 1972/73 වගා වර්ෂයේදී එය බුසල් 44·2 ක් විය. මෙය අස්වැන්නෙහි සියයට 4·1 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. 1972/73 වගා වර්ෂයේ අස්වැන්න නෙලා ගත් මුළු වපසරියෙන් සියයට 38·4 ක් තෙත් කලාපයෙහි සහ සියයට 61·6 ක් වියළි කලාපයෙහි වූ අතර, මුළු නිෂ්පාදනයෙන් සියයට 35·1 ක් තෙත් කලාපයෙන් ද, 64·9 ක් වියළි කලාපයෙන්ද විය. තෙත් කලාපයෙහි අක්කරයකට බුසල් 40·8 ක් හා දක්වන කල, වියළි කලාපයෙහි අක්කරයකට බුසල් 46·9 ක ඵලදාවකින් මෙය පැහැදිළි වේ. වියළි කලාපයෙහි වඩා වැඩි ඵලදාව, එම කලාපයෙහි සාපේක්ෂ වශයෙන් නිකුත් කළ වඩා වැඩි පොහොර ප්‍රමාණය (මුළු නිකුතුවෙන් සියයට 60·4 ක්) සහ සාපේක්ෂව දියුණු කළ වී වර්ග යටතේ වගා කළ වැඩි භූමි ප්‍රමාණයෙන් (මුළු වර්ග ප්‍රමාණයෙන් සියයට 70·9 ක් පැහැදිළි කෙරේ.

**1973/74 මහ කන්නය:** 1973 දෙසැම්බර් 31 දින දක්වා, 1973/74 මහ කන්නයේ වපුරන ලද අක්කර 1,080, 125 ක මුළු වපසරියෙන් සියයට 81·1 ක් දියුණු කරන ලද වී වර්ග යටතේ විය. 1973/74 මහ කන්නයේදී වපුරන ලද අක්කර ප්‍රමාණය කලින් වසරේ අනුරූප කාල සීමාවේ වපුරන ලද ප්‍රමාණයට වඩා සියයට 4·2 කින් වැඩිවීමක් පෙන්නුම් කරයි. එලෙසම 1973 දෙසැම්බර් 31 දින දක්වා වැඩිදියුණු කල බීජ වර්ග යටතේ වූ බිම් ප්‍රමාණයද, ඉකුත් මහ කන්නයේ අනුරූපි කාලසීම වෙහි දියුණු කල බීජ වර්ග යටතේ වූ බිම් ප්‍රමාණයට වඩා සියයට 14·0 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම: 1972/73 මහ කන්නයේදී සහතික මිල ක්‍රමය යටතේ වී මිලදී ගැනීම මුළු වී නිෂ්පාදනයෙන් සියයට 44 5 ක්වූ අතර, 1971/72 මහ කන්නයේදී මිලදී ගැනීම් සියයට 45 0 ක් විය. 1972/73 මහ කන්නයේදී මිලට ගත් ප්‍රමාණය බුසල් ලක්ෂ 187 ක්වූ අතර ඉකුත් මහ කන්නය තුළදී බුසල් ලක්ෂ 190 ක් විය. 1972/73 මහ කන්නයේ සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම් වලින් සියයට 87·5 ක් වියළි කලාපයෙන් විය.

ඉකුත් යල කන්නයේ සියයට 34·8 හා සලකන කළ 1973 යල කන්නයේදී සහතික මිල ක්‍රමය යටතේ මිලට ගත් වී ප්‍රමාණය මුළු නිෂ්පාදනයෙන් සියයට 18·9 ක් විය. නිරපේක්ෂ සංඛ්‍යාවන් අනුව 1972 යල කන්නයේ මිලට ගත් බුසල් ලක්ෂ 72 හා සසඳන කල 1973 යල කන්නයේදී, එය බුසල් ලක්ෂ 40 ක් විය. 1973 යල කන්නයේ සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම් වලින් සියයට 79·0 වියළි කලාපයෙන් විය.

---

1. වී අස්වැන්න පැහැදිළි කිරීමෙහි ලා මෙම සංඛ්‍යාවෙහි පිළිගත හැකි බව, ඉහතින් සඳහන් කළ සාධක අනුවම සීම.වෙයි.
2. මහ කන්නයේ වගා කරන ලද අක්කර ප්‍රමාණයෙන්, යල කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණයේ ප්‍රතිශතය ලබාගෙන එය සියයට එකතු කිරීමෙන් භෝග වගා දර්ශක ගණනය කරනු ලැබේ.

1972/73 වගා වර්ෂයෙහි සහතික මිල ක්‍රමය යටතේ මිලට ගැනීම් මුළු නිෂ්පාදනයෙන් සියයට 36·0 ක් විය ඉකුත් වගා වසරෙහිදී එය සියයට 41·6 ක් විය. නිරපේක්ෂ සංඛ්‍යාවන් අනුව, 1971/72 වගා වසරේදී බුසල් ලක්ෂ 262 සිට 1972/73 වගා වසරේදී බුසල් ලක්ෂ 226 දක්වා මිලදී ගත් වී ප්‍රමාණය සියයට 13·5 කින් අඩුවී තිබුණි. සහතික මිල ක්‍රමය යටතේ මිලට ගැනීම අඩුවීමට හේතුවිය හැක්කේ පදනම් මිලක් වශයෙන්, සහතික මිලෙහි කාර්යක්ෂමතාවය හීනකළ සහතික මිල සහ වෙළඳපල මිලඅතරෙහි වැඩිවෙමින් පැවති පරතරයයි.

## (ආ) අතිරේක ආහාර භෝග උප අංශය

1971/72 සහ 1972/73 වගා වර්ෂයන් සඳහා අතිරේක ආහාර භෝග උප අංශයෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දත්තයන් II (ආ) 2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### II (ආ) 2 වැනි සංඛ්‍යා සටහන

### 1971/72 සහ 1972/73 වගා වර්ෂයන් සඳහා (අ)

### අතිරේක ආහාර භෝග උප අංශයෙහි ක්‍රියාකාරිත්වය (ආ)

| අතිරේක ආහාර භෝග | වගා කළ ප්‍රමාණය (අක්කර) | | නිෂ්පාදනය (හොන්ඩර) | | අක්කරයක ඵලදාව (හොන්ඩර) | |
|---|---|---|---|---|---|---|
| | 1971 – 72 | 1972 – 73 | 1971 – 72 | 1972 – 73 | 1971 – 72 | 1972 – 73 |
| 1. මඤ්ඤොක්කා .. | 146,181 | 191,785 | 6,251,436 | 6,541,411 | 42·76 | 34·11 |
| 2. ඉරිඟු .. | 40,142 | 142,800 | 261,276 | 863,930 | 6·51 | 6·04 |
| 3. මිරිස් .. | 59,773 | 90,903 | 238,048 | 382,427 | 3·98 | 4·20 |
| 4. රතුළූණු .. | 14,253 | 17,288 | 1,222,965 | 1,332,945 | 85·80 | 77·10 |
| 5. රට කජු .. | 11,950 | 15,352 | 107,757 | 141,882 | 9·01 | 9·24 |
| 6. මුං ඇට .. | 7,053 | 12,966 | 24,571 | 58,411 | 3·48 | 4·50 |
| 7 අන්නාසි .. | 4,249 | 4,943 | 879,200 | 1,728,160 | 206·91 | 349·61 |
| 8. ඉදල් ඉරිඟු .. | 196 | 2,982 | 624 | 22,160 | 3·18 | 7·43 |
| 9. වැල් දෙඩම් .. | 1,683 | 1,942 | 168,300 | ලැ. නො. | 100·00 | ලැ. නො. |
| 10. සෝයා බෝංචි .. | 439* | 304* | 3,174* | 3,829* | 7·23 | 12·59 |
| 11. අර්තාපල් .. | 7,809 | 4,668** | 922,600 | 531,520* | 118·14 | 113·86 |
| 12. බොම්බයි ළූණු .. | 603* | 500 | 34,536* | 26,543 | 57·27 | 53·08 |
| 13. කුරක්කන් .. | ලැ. නො. | 53,944 | ලැ. නො. | 288,986 | ලැ. නො. | 5·35 |
| 14. තල .. | ලැ. නො. | 15,609 | ලැ. නො. | 49,316 | ලැ. නො. | 3·15 |
| 15. මෙනේරි .. | ලැ. නො. | 1,101 | ලැ. නො. | 3,932 | ලැ. නො. | 3·57 |
| 16. මෑ .. | ලැ. නො. | 563 | ලැ. නො. | 1,955 | ලැ. නො | 3·47 |
| 17. තනහාල් .. | ලැ. නො. | 178 | ලැ. නො, | 636 | ලැ. නො. | 3·57 |
| 18. උඳු .. | ලැ. නො. | 112 | ලැ. නො. | 998 | ලැ. නො. | 8·91 |
| 19. පරිප්පු .. | ලැ. නො. | 71 | ලැ. නො. | 987 | ලැ. නො. | 13·90 |

මූලයන්: කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

(අ) වගා වර්ෂය II (ආ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි පහතින් විග්‍රහ කර ඇත.

(ආ) තාවකාලික ඇස්තමේන්තු.

* යල පමණයි.

** මහ පමණයි.

ලැ. නො. - ලැබී නොමැත.

1972/73 වගා වර්ෂයේදී, සංඛ්‍යා සටහනෙහි ශීර්ෂගත කොට ඇති පළමු බෝග නමය යටතේ (මෙම භෝග සඳහා වර්ෂයන් දෙකේදීම වගාකළ බිම් ප්‍රමාණය පිළිබඳ සම්පූර්ණ දත්තයන් ලැබිණ) වන අක්කර ප්‍රමාණය ඉකුත් වසරට වඩා සියයට 68·5 කින් වැඩිවිය. සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති සෝයාබෝංචි සහ අර්තාපල්[1] හැර 1972/73 දී භෝග වගා කළ මුළු අක්කර ප්‍රමාණයෙන් සියයට 86·7 ක් මයියොක්කා, ඉරිඟු, මිරිස් සහ කුරක්කන් යටතේ විය. 1972/73 වගා වසරේදී මයියොක්කා ඉරිඟු සහ රතුළූනු සම්බන්ධ අක්කර ප්‍රමාණයෙහි වැඩිවීම සමග සැසඳූ කල, නිෂ්පාදනයෙහි සුළු අනුපාතික වැඩිවීමට මූලිකව හේතු විය හැක්කේ: (අ) වගාව යටතට පැමිණ වූ අළුත් ඉඩම්වල ආන්තික ස්වභාවය; (ආ) පළමුවරට අළුත් භෝග වගා කල නව වගාකරු වන්ට ප්‍රමාණවත් ශිල්පීය දැනීමක් නොවීම; (ඇ) සාපේක්ෂව ඉකුත් වසර හා සැසඳූ කල පැවති වඩා අයහපත් දේශගුණික තත්වයන්ය.

## 2. ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය

1973 ග්‍රාමීය අංශය සඳහා කෘෂිකාර්මික ණය මූලික වශයෙන් බෙදා හැරියේ නව කෘෂි කාර්මික ණය ක්‍රමය, සමූපකාර ග්‍රාමීය බැංකු සහ කෘෂි සේවා මධ්‍යස්ථානවල පිහිටුවා ඇති ලංකා බැංකුවේ උපකාර්යාල මගිනි. විවිධ සේවා සමුපකාර සමිතිවලට අනුබද්ධ ග්‍රාමීය බැංකු මගින් ක්‍රියාත්මක වන පරිදි අංග සම්පූර්ණ ණය ක්‍රමයක් 1973 දී ආරම්භ කරන ලදී. 1973/74 මහ කන්නයේදී මෙම ණය ක්‍රමයේ සමහර විධිවිධාන, දැනට පවතින කෘෂිකාර්මික ණය සහ ලංකා බැංකු ග්‍රාමීය ණය ක්‍රමයන්ටද උපයෝගී කර ගන්නා ලදී. මෙම ණය ක්‍රම තුන මගින් වර්ෂය තුළ බෙදා හරින ලද ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 1,386 කි. මීට අමතරව නියමිත කාර්යයන් සඳහා රජයේ දෙපාර්තමේන්තු විසින් මෙහෙය වනු ලැබූ ණය ක්‍රම මගින්ද, වාණිජ බැංකු සහ විශේෂිත ණය දෙන ආයතන මගින්ද ග්‍රාමීය අංශයට ණය සපයන ලදී.

ඉහත සඳහන් ණය ක්‍රම යටතේ නියමිත බෝග සඳහා දෙනු ලබන වගා ණය වලින් ගෙවීම් පැහැර හරින ප්‍රමාණයෙන් සියයට 75 ක් සඳහා, රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇප වෙයි.

### ( i ) අංග සම්පූර්ණ ග්‍රාමීය ණය ක්‍රමයේ විධිවිධාන

අංග සම්පූර්ණ ග්‍රාමීය ණය ක්‍රමය, ග්‍රාමීය අංශයේ සෑම ණය අවශ්‍යතාවයක්ම ඒකාබද්ධ ස්වරූපයකින් ලබා දීම සඳහා නිර්මානය කරන ලද්දකි. මෙම ණය ක්‍රමයෙන් ඉදිරිපත් කළ වැදගත් වෙනස්කම් පහත දක්වේ:

1. ණය පහසුකම් සැපයෙනුයේ විවිධ සේවා සමුපකාර සමිතිවල පිහිටුවා ඇති සමුපකාර ග්‍රාමීය බැංකු මගිනි. ග්‍රාමීය බැංකු පිහිටුවා නොමැති ස්ථානයන්හි හෝ අංග සම්පූර්ණ ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම පටන් නොගත් ස්ථානයන්හි පෙර පරිද්දෙන්ම මහජන බැංකුව වගා ණය විවිධ සේවා සමුපකාර සමිති මගින් බෙදා දෙයි. කෙසේ වුවද, නොයෙක් බෝගයන් සඳහා ණය ප්‍රමාණය තීරණය කිරීමේදී, මහජන බැංකුව මගින් අනුගමනය කරනුයේ අංග සම්පූර්ණ ණය ක්‍රමය යටතේ ඇති අනුමත ණය සීමාවන්ය.

2. ග්‍රාමීය බැංකු පිහිටුවා තිබෙන ස්ථානයන්හි නිෂ්පාදනය හා පාරිභෝජනය සඳහාත්, නිවාස ණය බේරීම සහ හදිසි කටයුතු සඳහාත් වසර පුරාම ණය සැපයෙනු ලැබේ. කෘෂිකාර්මික විකුණුම්වලින් ලැබෙන ආදායම් සහ අනෙකුත් ග්‍රාමීය මුදල් ක්‍රියකාරී ලෙස යෙදවීමෙන් ග්‍රාමීය ඉතුරුම් සහ ග්‍රාමීය ණය අතර සම්බන්ධතාවයන් තහවුරු කෙරෙනු ඇත.

---

1. දත්තයන්හි පවත්නා අසම්පූර්ණ ස්වභාවය නිසා මෙම භෝගයන් දෙක අඩංගු නොවේ.

3. මෙම ණය ක්‍රමය යටතේ ණය සීමාවන් කාර්යය සහ ප්‍රදේශය අනුව වෙනස් වෙයි. ග්‍රාමීය බැංකු ක්‍රියාත්මක වන ස්ථානයන්හි ණය බෙදා හැරීම මෙන්ම අවසාන වශයෙන් ණය ප්‍රයෝජනයට ගැනීම පිරික්සීම පිළිබඳ තීරණ විමධ්‍යගත කර ඇත. පොහොර සහ කෘෂි රසායන සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය හැර ප්‍රදේශයේ අවශ්‍යතාවයන් ගැන සළකමින් කාර්යයන් අතර කෘෂිකාර්මික ණය වෙනස් කිරීමට පුළුවන. මුදල් පරිමාණය අනුව ණය සීමාවන් III වැනි පරිශිෂ්ඨයෙහි 63-69 දක්වා ඇති සංඛ්‍යා සටහන්වල දක්වේ.

මෙම ණය ක්‍රමයේ සමහර වැදගත් සංශෝධන පහත දක්වේ:

1. ණය සීමාවන් ඒ ඒ ප්‍රදේශවලට, බීජ වර්ග සහ භෝගවලට සරිලන ලෙස සකස් කිරීම විවිධ නිෂ්පාදන අවශ්‍යතාවයන් අනුව ණය පාවිච්චියට රුකුලක් වන අතර, එමගින් සම්පත් විභජනය පිළිබඳ ආර්ථික තාර්තිකත්වයේ මට්ටමෙහි වර්ධනයක් සිදු කරනු ඇත.

2. නව කෘෂිකාර්මික ණය ක්‍රමය අසාර්ථක වීමට ප්‍රධාන හේතුවක් වූයේ ණය ආපසු අය කර ගැනීමෙහිදී ණය දෙන ආයතනයට සෑහෙන ප්‍රමාණයක ඍජු බලයක් නොතිබීමය. ඊට ප්‍රතිවිරුද්ධ වශයෙන් අංග සම්පූර්ණ ණය ක්‍රමය, ග්‍රාමීය මුදල් යොදා ගනිමින් ග්‍රාමීය බැංකු සහ ලංකා බැංකු උප ශාඛා මගින් ක්‍රියාත්මක කිරීමට නිර්මාණය කර ඇත. මෙම ආයතන ක්‍රමක්‍රමයෙන් ස්වකීය මුදල් ණය දීමට යොදවන අතර ඒවා ආපසු අය කර ගැනීම සඳහා වගකීමද දරනු ඇත.

සම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයෙන් ඉහළ නිෂ්පාදන මට්ටමක් පවත්වා ගැනිම පිණිස, ණය ගැනීමට සුදුසු නොවූවන් අතර ණය දීමට සිදුවීම, සෑම ණය ක්‍රමයකටම පොදු ප්‍රශ්නයක් විය. අඩු වශයෙන් ආරම්භක අවස්ථාවන්හිදී මෙම ප්‍රශ්නය අංග සම්පූර්ණ ණය ක්‍රමයටද බලපානු ඇත.

## (ii) නව කෘෂිකාර්මික ණය ක්‍රමය

විවිධ සේවා සමුපකාර සමිතිවල අංශ වශයෙන් ග්‍රාමීය බැංකු පිහිටුවනු නොලැබූ ස්ථානයන්හි හෝ මෙම බැංකු විසින් අංග සම්පූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ නොකළ ස්ථානයන්හි හෝ 1967 නව කෘෂිකාර්මික ණය ක්‍රමය ක්‍රියාත්මක විය. මෙවැනි අවස්ථාවලදී අංග සම්පූර්ණ ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත කළ වැඩි කරන ලද සීමාවන් යටතේ මහජන බැංකුව විසින් දෙනු ලබන ණය මුදල් බෙදා හැරීමට, විවිධ සේවා සමුපකාර උපකාරී වෙයි. ග්‍රාමීය බැංකු ක්‍රියාත්මක නොවූ ස්ථානයන්හි, පාරිභෝජන ණය දීමට සහ තැන්පත් ඒකරාශි කිරීමට අදාළ, අංග සම්පූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ විධිවිධාන ක්‍රියාත්මක නොවේ.

ග්‍රාමීය බැංකු සහ ලංකා බැංකුවේ උප කාර්යාල සංඛ්‍යාව සැළකිය යුතු ලෙස වැඩිවී තිබියදීත්, වගා ණය සඳහා ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් නව කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය තවදුරටත් පැවතියේය. වී සහ අතිරේක භෝග සඳහා 1973 වර්ෂය තුළදී දෙන ලද රුපියල් ලක්ෂ 1,024 ක මුළු මුදලින් රුපියල් ලක්ෂ 978 ක් මෙම යෝජනා ක්‍රමය යටතේ දෙනු ලැබිය.

## (අ) වී වගා ණය

නව කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණය, ආපසු අය කළ ක්‍රමය හා ප්‍රමාණය, වගා හානිය නිසා ගෙවනු ලබන කාලසීමාවන් දීර්ඝ කළ ණය මුදල් ප්‍රමාණය සහ පැහැර හැරි ප්‍රමාණය II (ආ) 3 වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කොට ඇත.

## II (ආ) 3 වැනි සංඛ්‍යා සටහන

### නව කෘෂිකාර්මික ණය ක්‍රමය — වී වගා ණය

| ශීර්ෂය | ප්‍රමාණය රුපියල් දශලක්ෂ වලින් | | | | | | | | | | | | | දෙන ලද මුදලේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 | යල 1972 | මහ 72/73 | යල* 1973 | මහ* 73/74 | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 | යල 1972 | මහ 72/73 | යල* 1973 | මහ* 73/74 |
| දෙන ලද ණය .. | 61·4 | 11·3 | 45·8 | 9·9 | 39·3 | 12·3 | 23·5 | 5·8 | 24·0 | 6·7 | 20·3 | 7·9 | 60·9 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |
| මුළු ආපසු ගෙවීම .. | 52·5 | 9·6 | 27·9 | 8·0 | 19·9 | 8·4 | 12·1 | 4·8 | 13·8 | 4·8 | 11·5 | 2·9 | 0·4 | 85·6 | 84·9 | 60·9 | 80·8 | 50·6 | 68·3 | 51·5 | 82·8 | 57·5 | 71·6 | 56·6 | 36·7 | 0·7 |
| **එයින්:** | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| (අ) සිය කැමැත්තෙන් .. | 43·5 | 9·1 | 25·8 | 7·7 | 19·9 | 7·8 | 12·1 | 4·8 | 13·8 | 4·8 | 11·5 | 2·9 | 0·4 | 70·8 | 80·5 | 56·3 | 77·8 | 50·6 | 63·4 | 51·5 | 82·8 | 57·5 | 71·6 | 56·6 | 36·7 | 0·7 |
| (ආ) සහල් සලාකයෙන් .. | 9·0 | 0·5 | 2·1 | 0·3 | — | 0·6 | — | — | — | — | — | — | — | 14·6 | 4·4 | 4·6 | 3·0 | — | 4·9 | — | — | — | — | — | — | — |
| බෝග විනාශය නිසා දීර්සකිරීම· | 0·1 | — | 0·9 | 0·1 | 0·4 | — | — | — | — | — | — | — | — | 0·2 | — | 2·0 | 1·0 | 1·0 | — | — | — | — | — | — | — | — |
| පැහැර නොහැරීම .. | — | — | — | — | — | — | — | — | — | 0·1 | 0·5 | 3·9 | 60·5 | — | — | — | — | — | — | — | — | — | 1·5 | 2·5 | 49·4 | 99·3 |
| පැහැර හැරීම .. | 8·8 | 1·7 | 17·0 | 1·8 | 19·0 | 3·9 | 11·4 | 1·0 | 10·2 | 1·8 | 8·3 | 1·1 | — | 14·4 | 15·1 | 37·1 | 18·2 | 48·4 | 31·7 | 48·5 | 17·2 | 42·5 | 26 9 | 40·9 | 13·9 | — |

* අසම්පූර්ණ දත්තයන්.

මූලය: මහජන බැංකුව·

නව කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය ආරම්භ කළ මුල් අවදියේ සිටම, ණය මුදල් ප්‍රයෝජනයට ගැනීමේ පහළ වැටෙන උපනතිය, 1972/73 මහ කන්නයේදී තවදුරටත් පැවතියේය. එය ඉකුත් මහ කන්නයේ බෙදා හරින ලද ප්‍රමාණයට වඩා සියයට 15·4 කින් මෙම කන්නයේ දෙන ලද ණය මුදල් පහළ වැටීමෙන් පෙන්නුම් කෙරේ. 1973 යල කන්නයේදී ප්‍රයෝජනයට ගත් ණය ප්‍රමාණය, ඉකුත් වර්ෂයේ යල කන්නයේදී ප්‍රයෝජනයට ගත් ප්‍රමාණයට වඩා සියයට 17·9 කින් වැඩි විය. 1972/73 වගා වර්ෂය සඳහා (1972/73 මහ සහ 1973 යල දෙකන්නයටම) ප්‍රයෝජනයට ගත් ණය ප්‍රමාණය ලක්ෂ 195 ක් විය. මෙය ණය ක්‍රමය ආරම්භ කළ 1967/68 වගා වර්ෂයේදී ප්‍රයෝජනයට ගත් රුපියල් ලක්ෂ 727 ක ප්‍රමාණයට වඩා සියයට 61·2 කින් අඩුවීමකි. පැහැර හැරීම් වැඩිවීම නිසා ණය ලැබීමට නුසුදුසු ගොවීන්ගේ සංඛ්‍යාව වැඩිවීම මෙම අඩුවීමට ඉවහල් වූවා විය හැකිය.[1] 1972/73 වගා වර්ෂයේදී ණය මුදල් ප්‍රයෝජනයට ගැනීම අඩුවීමේ ප්‍රමාණය කෙරෙහි අයහපත් දේශගුණිකතාවයන්ද බලපාන්නට ඇත.

1973/74 මහ කන්නය සඳහා වන සංඛ්‍යාවන් අසම්පූර්ණ වෙතත්, මෙම කන්නයේ ණය මුදල් ප්‍රයෝජනයට ගැනීමට පෙර මහ කන්නයේ රුපියල් ලක්ෂ 203 සිට රුපියල් ලක්ෂ 609 දක්වා සියයට 200·0 කින් වැඩිවීමෙන් ණය මුදල් බෙදා හැරීම පහත වැටුණ උපනතියේ ඉතා තියුණු ප්‍රත්විරුද්ධතාවයක් දක්වයි. දැනට කෙරී ගෙන යන වගා කන්නය තුළදී අමතර අරමුදල් නිකුත් කිරීම සමග මෙම සංඛ්‍යාව තවදුරටත් වැඩිවේ යයි බලාපොරොත්තු වේ. මෙම වැඩිවීමට මූලික වූයේ: (අ) අක්කරයකට රුපියල් 316 සිට රුපියල් 385 දක්වා බර නොතබන ලැබූ සාමාන්‍යයක් දක්වා අංග සම්පූර්ණ ණය ක්‍රමය යටතේ ණය සීමාවන් ඉහළ යන පරිදි වැඩි කිරීම; (ආ) පොහොර හා කෘෂිරසායනිකයන් සඳහා පාර්ශ්වික ණය සහ අනිකුත් කටයුතු සඳහා මීට අමතරව අක්කරයකට රුපියල් 100/- ක මුදලක් (රුපියල් 300 ක උපරිමයක් දක්වා) ලබා ගැනීමට, ණය ලැබීමට නුසුදුසු වූ ගෙවීම් පැහැර හැරි ණය ගැනුම්කරුවන් යළිත් සුදුසුවීම;[2] (ඇ) ආහාර වගාව කෙරේ වැඩි අවධානය සහ කෘෂිකර්මයෙහි ආයෝජනය කිරීම වඩාත් ලාභදායිවීම නිසා ණය ඉල්ලන නව වගාකරුවන් සංඛ්‍යාව වැඩිවීමත්‍ය.

1971/72 මහ කන්නයේදී සියයට 57·5 ක්වූ ආපසු ගෙවීම් හා සසඳන කළ 1972/73 මහ කන්නයේදී ණය ආපසු ගෙවීම සියයට 56·6 කි. 1973 යල කන්නය සඳහා වන ණය මුදල් ආපසු අය කර ගැනීමේ සංඛ්‍යාවේ අසම්පූර්ණ ස්වභාවය සළකන කළ, 36·7 ක්වූ ණය ආපසු අය කර ගැනීමේ අනුපාතිකය පැහැර හැරීමේ නියම ප්‍රමාණය නොපෙන්වයි. ඉහතින් දක්වන ලද හේතු නිසා 1973/74 මහ කන්නය සඳහා වන ණය ආපසු අයකර ගැනීමේ අනුපාතිකය වැඩි දියුණු වේ යයි අපේක්ෂා කෙරේ.

1972/73 මහ සහ 1973 යල කන්නයන් සඳහා දිස්ත්‍රික්ක අනුව, ණය මුදල් ප්‍රයෝජනය ගැනීම සහ ආපසු අය කර ගැනීමේ මට්ටම III වැනි පරිශිෂ්ඨයේ 70 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1972/73 වගා වර්ෂයේදී වැඩිම ප්‍රමාණයක ණය මුදල් දෙන ලද්දේ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 21·5 ක් නියෝජනය කළ රුපියල් ලක්ෂ 61 ප්‍රමාණයක් බෙදා හළ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහිය. 1972/73 මහ කන්නයේදී සියයට 90·9 ක අනුපාතිකයක් සහිතව බදුල්ල දිස්ත්‍රික්කයෙහි ඉහළම ආපසු අයකර ගැනීම් විය.

---

1. 1972, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ, "නව කෘෂිකාර්මික ණය ආපසු ගෙවීම පැහැර හැරීම පිළිබඳ සමීක්ෂණය" මගින්, මෙම ඉහළ පරිමාණයේ පැහැර හැරීම්වලට හේතු විස්තර කොට ඇත.

2. කල් පසුවූ ණය ආපසු ගෙවීම් පැහැර හැරි ණය ගැනුම්කරුවන්ට තුන් අවුරුදු කාලසීමාවක දීර්ඝ කිරීමක් දෙනු ලැබීය. මෙම ණය ආපසු ගෙවිය යුත්තේ 1973/74 මහ කන්නයේ සිට ආරම්භ වන සමාන වාරික 3 සිට 6 දක්වා ප්‍රමාණයකිනි. මීට ඉහතින් ගන්නා ලද ණය ආපසු ගෙවීමට පෙළඹවීම සඳහා මෙම ණය සඳහා අය කර ගත යුතු පොළිය 1973 අගෝස්තු මස සිට නවත්වා ඇත.

## ( ආ ) අතිරේක ආහාර භෝග සඳහා ණය

